# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2024.12.24 පැය 1935 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 1881/2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## 22 වන ජ්‍යෙෂ්ඨ රථවාහන කළමනාකරණ හා 44 වන කණිෂ්ඨ රථවාහන කළමනාකරණ පාඨමාලා හදාරන ලද නිලධරයන්ගේ විසිර යාමේ උත්සවය

මහජනතාව වෙත වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දීම අරමුණු කරගනිමින් රථවාහන මූලස්ථානය විසින් රථවාහන අංශ වල නිලධරයන් සඳහා රථවාහන සහ මාර්ග ආරක්ෂාව සම්බන්ධව විවිධ පාඨමාලා පවත්වනු ලබයි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධරයන් සඳහා රථවාහන නීතිය මෙන්ම එහි ප්‍රායෝගික භාවිතය සම්බන්ධව අවශ්‍ය කරන දැනුම ලබාදීම සඳහා රථවාහන කළමනාකරණ පාඨමාලාවන් ආරම්භ කරන ලදි.

ඒ අනුව පවත්වන ලද 22 වන ජ්‍යෙෂ්ඨ රථවාහන කළමනාකරණ පාඨමාලාව හා 44 වන කණිෂ්ඨ රථවාහන කළමනාකරණ පාඨමාලාව සාර්ථකව අවසන් කරන ලද පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ පොලිස් නිලධරයන් 119 ක් හා කණිෂ්ඨ ශ්‍රේණියේ පොලිස් නිලධරයන් 96 දෙනෙකු සඳහා සහතික පත්‍ර හා ලාංඡන ප්‍රදානය කිරීමේ උත්සවය 2024 දෙසැම්බර් 24 දින දින අපරාධ වාර්තා කොට්ඨාස ශ්‍රවණාගාරයේදී වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මෙම පාඨමාලව තුලින් රථවාහන නීතිය එහි ප්‍රායෝගික භාවිතය පිළිබඳව මෙන්ම අධිකරණයේ රථවාහන නඩු මෙහෙයවීම සම්බන්ධයෙන් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විසින් දේශණ සිදු කර ඇති අතර යතුරුපැදි ඇතුළු පොලිස් වාහන පැදවීමේ ප්‍රවීණතාවය ලබා දීම ද සිදුකරන ලදි.

මෙම අවස්ථාව සඳහා අපරාධ සහ රථවාහන භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රන්මල් කොඩිතුවක්කු, රථවාහන පාලන හා මාර්ග ආරක්ෂාව නියෝජ්‍ය පොලිස්පති ඉන්දික හපුගොඩ හා රථවාහන මූලස්ථානයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මනෝජ් රණගල යන මහත්වරු ඇතුළු උසස් පොලිස් නිලධාරීන් රැසක් සහභාගී විය.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්











**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**